Revolution 173, අගෝස්තු 16, 2009
From A World to Win News Service

# ඉරානයඃ උඩු තෙරපුම සුවිශේෂ තත්ත්වයක පවතී

මෙම ප්‍රකාශන තැපැල් මගින් සංසරණය වීමට පටන්ගත්දා සිටම වැඩිදුර සංවර්ධනයක් සාක්‍ෂාත් කරගෙන ඇත. අගෝස්තු 03 දින ''උත්තරීතර නායක'' අයතොල්ලා අලි කමෙනි (Ayatollah Ali Khamenei) ජනාධිපති අහමදිනිජාඩ් (Ahmadinejad) නැවත තෝරා පත් කිරීම පිළිබඳ සිය අනුමැතිය දක්වන විටදීත්, එමෙන්ම නැවත අගෝස්තු 05 දින, අහමදිනිජාඩ් විධිමත්ව දිවුරුම් දී නිළයට පත් කරන විට, ආණ්ඩුව තුළම සිටින විරුද්ධවාදීන් විසින් එම උත්සවය වර්ජනය කර ඇත. (මෙය සුවිශේෂ තත්ත්වයකි, සමහර විට පෙර නොවූ විරූ තත්ත්වයකි.) එහිදී වීදිවල විරෝධතා දැකිය හැකි විය; ඒවා වාර්තාවන අන්දමට කුඩා වූවද, දැවැන්ත පොලිස් හා හමුදා මැදිහත් වීම නිසාත්, ආණ්ඩුවේ විරුද්ධවාදීන්ට එරෙහි මර්ධනය දිගටම කෙරීගෙන යන නිසාත් විරෝධතා විසුරුවා හරින ලදි. මීට පෙර රාජ්‍ය පාලනයට ඉතා ශක්තිමත්ව උනන්දුවෙන් සහයෝගය දැක්වූ ග්‍රාමීය ප්‍රදේශවල පවා අහමදිනිජාඩ් ට එරෙහි විරෝධය වර්ධනය වන බව වාර්තා වේ. (ඒ 2009 අගෝස්තු 04 වැනි දා නිව්යෝර්ක් ටයිම්ස් සඟරාවෙනි)

ඉරානය දුර්වල කිරීමට හා මෙල්ලකර ගැනීමට අධිරාජ්‍යවාදීන් කරගෙන යන ප්‍රයත්න වල පාර්ශවයක් ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය ඉරානයට එරෙහි වක්‍රාකාර තර්ජන දියත් කරමින් සිටී. පිරිපහදු කරන ලද පැට්‍රෝලියම් නිෂ්පාදිත ගැසොලින්ද ඇතුළුව ඉරාන තෙල් අපනයනයන් කප්පාදු කර ඉරානයට එරෙහි ''උපරිම'' ආර්ථික සම්බාධක පැනවීම පිළිබඳ ඔබාමා පරිපාලනයද කටයුතු කිරීමට සලකා බලමින් සිටින බව වාර්තා වේ. එයින් ඉරානයේ වැඩ කරන ජනතාවට මෙන්ම පාලකයන් යන දෙකොටසටම බරපතල බලපෑමක් ඇති වී තිබේ. චලනයක හා ප්‍රතිචලනයක වර්ධනීය සර්පිලයක් ඉන් මුදා හැර තිබේ; පර්සියානු මුහුදේ එහා මෙහා යන නැව් නවතා ලන බවටත්, තෙල් අපනයනය අත්හිටුවන බවටත් ඉරානය තර්ජනය කර තිබේ; (මේ හරහා තෙල් ගලායාමෙන් 20% ආවරණය වේ.) එසේ එය සිදුවන්නේ නම්, ඇමෙරිකාවෙන් මිලිටරිමය ප්‍රතිචාරයක් සිදු වීමට ඉඩ තිබේ.

ඉරානය සම්බන්ධයෙන් පසුබිම විමසා බලමුඃ **''ඉරාන වරුන්ගේ නැගී සිටීමක මූලයන්;දූෂණය, අශිෂ්ඨත්වය, විනාශය, අවිචාරය ලබ්ධිය, අඳුරු ආගමික අවිද්‍යාව, විෂ මත්ද්‍රව්‍යට ඇබ්බැහිවීම සහ ගණිකා වෘත්තිය තුළ සමාජයක් ගිලී සිටීම'';** ලැරී එවරෙස්ට් විසින් පෙන්වාදෙන; **''ඉරාන පාලක කවය තුළ ගැඹුරු භේද භින්නවීම හෙළිදරව් කරන මැතිවරණ වංචාවන්ට ලබා දෙන ප්‍රතිචාර; රාජ්‍ය පාලනය පුළුල් පදනමකින් ඉරානය තුළ නැගී සිටීම.''** V.T. විසින්; එමෙන්ම **''ඇමෙරිකා එක්සත් ජනපදය සහ ඉරානය අතර යුද්ධයක් ඇති වීමේ ගම්‍යතාවය පිළිබඳ තක්සේරුවක්; හේතු කාරක සහ විභවය ශාඛා විහිදුම පැතිර යාම''** ක්‍රියාකාරී කණ්ඩායමකින් මූලිකව සොයා ගැනීම.

2009 අගෝස්තු 03 **දිනාගැනුමට ලොවක් ඇත** (A World to Win) ප්‍රවෘත්ති සේවයට අනුව; නිර්භය විරෝධතාවල අවසාන වටයේදී සැලකිය යුතු ඉරානවරු පිරිසක් පැහැදිලිවම ප්‍රකාශ කර සිටියේ සිරිත් පරිදි සිය කටයුතු වල නිරත වීම ප්‍රතික්ෂේප කරන බවයි. ඇත්ත වශයෙන්ම විරුද්ධ පක්ෂය ඒ වගේමයි. විවිධ මූලාශ්‍ර මගින් හෙළිවන වාර්තා විමසද්දී, විමුක්ති අරගල පොඩි පට්ටම් කර දැමීමේ රාජ්‍ය පාලන ක්‍රමයේ ප්‍රයත්නය නිසා බොහෝ මිනිසුන් අධිෂ්ඨාන සහගතව ක්‍රියාකර ඇත්තේ පවත්නා ක්‍රමය බිඳ වැටෙන තුරු අඛණ්ඩව අරගලය ඉදිරියට ගෙන යාමයි. ''බිය නැතිවීම ස්පර්ශයෙන් දැනෙන්ට පටන් අරගෙන'' එක් තරුණ කාන්තාවක් විද්‍යුත් තැපෑලේ සඳහන් කර තිබුණි.

ජුලි 30 බ්‍රහස්පතින්දා, නෙඩා අග්හා සොල්තාන් (Neda Agha-Soltan) , සෝරාබ් අරාබි (Sohrab Araabi), අෂ්කාන් සෝරාබි (Ashkan Sohrabi) සහ බොහෝ තරුණ විරෝධතා කරුවන් ජුනි 20 වැනිදා ඉරාන ආරක්ෂක හමුදා විසින් ඝාතනය කර දමා දින 40 කට පසුව, දස දහස් ගණනක් ජනතාව (විවිධ වාර්තාවලට අනුව 40 දහසකට වැඩි පිරිසක්) දකුණු ඉරානයේ විශාලතම ප්‍රධාන සුසාන භූමිය පිහිටා තිබෙන බිහෙෂ්ට්-ඊ ෂාරා (Behesht-e Zahra) කරා දුම්රිය හා වෙනත් වාහන වලින් ඇදී ආවේ, ෂියා සම්ප්‍රදාය අනුව මිය ගිය අය දින 40 කට පසු සැමරීම වෙනුවෙන්, ඉස්ලාමීය රාජ්‍ය පාලනය ට සහ විශේෂයෙන්ම ඉරාන ''උත්තරීතර නායක'' අයතොල්ලා අලි කමෙනි ට මෙන්ම ජනාධිපති මහමුඩ් අහමදිනිජාඩ් ට එරෙහි අඛණ්ඩ විරෝධතා ව්‍යාපාරයට සහයෝගය දැක්වීමටයි.

උතුරු හා මධ්‍යම ටෙහෙරාන්වල, දස දහස් ගණනින් තරුණ තරුණියන් ප්‍රධාන මං මාවත් වල හා චතුරස්‍රවල ඒකරාශී වන්නට වූහ. වනාක් චතුරස්‍රය, මොතාහාරී මාවත, බිහැස්ටි මාවත, උතුරු හාෆේෂ් මාවත, වැලයි අර්ස් මාවත, ෂාර්ටොස්ටි මාවත, ෆර්ඩසයි චතුරස්‍රය, ෆෑටෙමයි මාවත යනාදී ස්ථානවල විශාල ජන සහභාගිත්වයෙන් විරෝධතා පැවති බවට වාර්තා ලැබේ. ඔවුහු ආණ්ඩුව විවේචනය කරමින් සටන් පාඨ කියමින් කැරලි මර්ධන පොලීසිය හා සිවිල් ඇඳුමින් සැරසුණු බල ඇණි සමගින් ගැටුණි. අනෙක් නගරවල ජනතාව රාජ්‍ය පාලන තන්ත්‍රයට එරෙහි විරෝධතා දැක්වීමට වීදි බැස්සෝය. පළාත්බද ප්‍රදේශවලින් පැමිණි බොහෝ ජනයා, එදින අගනුවරට රැස්වූහ.

ජනාධිපති අපේක්ෂක මීර්-හුසේන් මව්සාවි (Mir-Hussein Mousavi) මෙම විශේෂ උත්සවය පැවැත්වීම සඳහා බලධාරීන්ගෙන් අවසර ලබාගත් ස්ථානය වන අති විශාල මොසාලා මුස්ලිම් දේවස්ථානය ට විශාල ජනකායක් පැමිණීමට උත්සාහ දැරූහ. රාජ්‍ය පාලන තන්ත්‍රය එම දේවස්ථානයයේ හෝ අන් ස්ථානයක රැස්වීම් පැවැත්වීමට අවසර දීම ප්‍රතික්ෂේප කරන ලදි. රැස්වූ විරෝධතා කරුවන් කැරලි මර්ධන පොලිස් භටයින් විසින් විසුරුවා හරින ලදුව, වැලයි අස්ර් චතුරස්‍රය වටා පිහිටි සෑම මං මාවතකම මොවුහු විසිර ගියහ.

මං මාවත් වල සහ පසෙකින් ගමන් කළ විරෝධතා කරුවන්ට අමතරව, සෙසු සාමාන්‍ය ජනයා, විවිධ අයුරින් ඔවුන්ගේ සහයෝගය ප්‍රදර්ශනය කළෝය. උදාහරණයක් ලෙස දක්වතොත්, ටෙහෙරානයේ විවිධ ප්‍රදේශවලත්, විශේෂයෙන් පැවති

වාහන තද බදයේදී, රියදුරන් සමගාමී රිද්මයකට අනුව නලා හැඬවීය. සමහර රියදුරන් සිය රථයෙන් බැස ''ඒකාධිපතියා භංග වේවා!'' යි හඬ නැගීය. මින් කෝපයට හා වියරුවට පත් ආරක්ෂක හමුදාවෝ වාහන වල වීදුරු පොඩි පට්ටම් කිරීමටත් නලා හැඬවීම හැර අන් කිසි දෙයක් සිදු නොකළ රිදුරන්ට තඩි බෑමටත්, කිසිදු හේතුවක් නැතිව පාරේ ගමන් කළවුන්ට පහර දෙන්නටත් වූහ. මීට ඉහත විරෝධතා ව්‍යාපාර වලදී මෙන්, පොලිස් ප්‍රහාර වලින් බේරී පලා යන්නවුන්ට, අසල්වාසී ජනයා සිය නිවෙස් වල දොරගුළු විවෘත කර ආරක්ෂා කළ බවට ගිණිය නොහැකි තරම් වාර්තා තිබේ.

ජනතාව එක්රැස් වීම සම්බන්ධයෙන් බියට පත් ආණ්ඩුව, ඔවුන්ව ටෙහෙරාන්වල විවිධ පැති වලට පන්නා දැමීමට කළ හැකි සෑම පියවරක්ම ගනු ලැබූ අතර, මෙය තම වාසියට හරවා ගත් තරුණයන් ආරක්ෂක හමුදා ළඟා වීමට පෙර, හැකි සෑම අස්සක් මුල්ලක් නෑරම සිය විරෝධතා ව්‍යාපාරය ගෙන ගියෝය. මෙම අරගලයේ අත්දැකීම් වලින් සමන්විත ජනතාව තව තවත් අත්දැකීම් ලබා ගනිමින් ඉදිරියට යමින් සිටිති. උදාහරණයක් ලෙස බොහෝ තරුණයෝ සිය මුහුණු ආවරණය කරමින් සිටි. සමහර තරුණ කාන්තාවෝ සිය උරසළු වලින් මුහණු වසා ගනිමින්, සිය වරලස මුදා හැර, සිය උරතලය හා හිස් සෘජුව තබා ගෙන සැරිසරමින්, ඔවුන් වෙත පනවන ලද තහංචි හා නීති රීති ප්‍රතිවර්තනය කළෝය (reversed). බොහෝ තරුණයින් මෙම කොටුකර අහුරණ ලද දේවස්ථානයට යාමට අදිමදි කළේ, යම් විදියකින් නිළ ඇඳුම් ලාගත් හෝ සිවිල් පොලිස් නිළධාරීන් හෝ මැරවරයින් පහරදුන හොත් ඉන් බේරී පලා යාමට නොහැකි නිසා බවට ඕනෑ තරම් වාර්තා තිබේ. ඉනික්බිතිව, එම ස්ථානය දේවස්ථානයක් බැවින්, බොහෝ සංවෘත පරිපථ කැමරා (Closed circuit cameras) ගොඩනැගිලි ඉස්මත්තේ සවි කර තිබේ.

බිහෙස්ට්-ඊ-ෂාරා (Behesht-e Zahra) ඇතුළුව, ටෙහෙරානයේ විරෝධතා ව්‍යාපාර පැවති සෑම තැනකම කැරලි මර්ධන පොලීසිය විරෝධතා කරුවන් සමග ගැටුණි. බිහෙස්ට්-ඊ-ෂාරා වලදී මව්වරු අත්වැලක් සාදාගෙන සහභාගි වූ ජනයා අරක්ෂා කළෝය. අනෙක් සෑම ස්ථානයකදීම කැරලි මර්ධන හමුදාවෝ විරෝධතා කරුවන්ට අවිචාරවත්ව පහරදී ඇත. ඔවුහු ජනතාවට පහර දී තිබුණේ විද්‍යුත් ගිනි අවි, (electric Taser guns) හා යකඩ දම්වැල්, හා බැටන් පොලු යොදා ගනිමින්ය. ඊට බාධා කරමින් නගරයේ අප ද්‍රව්‍ය හා කැලි කසල භාජන වලට ගිනි තැබූ සටන්කාමී විරෝධතා කරුවන්ට කඳුලු ගෑස්, ගම්මිරිස් ගෑස් යොදා ගනිමින් හමුදා ප්‍රහාර දියත් කර ඇත. ඔවුන් සායම් තැවරූ රබර් උණ්ඩ යොදා විරෝධතා කරුවන්ට පහර දී තිබුණේ, පසුව ඔවුන් හඳුනා පැහැර ගෙන යාමටයි. රසායනික අවි යොදා ගනිමින් පහර දී ඇත්තේ, පහර කෑමෙන් අඩපණව ඇද වැටෙන සටන්කාමීන් ආරක්ෂක හමුදා අත් අඩංගුවට ගෙන පහර දී, සිරගත කිරීමට බව විරෝධතා නැගූ අය විශ්වාස කරති. අඩු තරමින් අවස්ථා දෙකක දී ජංගම දුරකථන කැමරා මගින් හඳුනා ගත් ජනයාට ගිනි අවි වලින් පහර දී තිබුණි. කෙසේ නමුත් මේ වන තුරු මිය ගිය වුන් පිළිබඳ වාර්තා වී නොමැත. කිසිදු ආකාරයකින් විශ්වාසය තැබිය නොහැකි රාජ්‍ය තන්ත්‍රයට අනුව 50 කට වැඩි පිරිසක් අත් අඩංගුවට ගත් බව වාර්තා වේ. මීට පෙර අත් අඩංගුවට ගත් අන් අයට සිදු වී ඇති දේ විනිශ්චය කිරීමේදී, ඔවුන්ටද බරපතල වද හිංසාවලට භාජනය වීමට බොහෝ විට ඉඩ තිබේ.

## ''නිදහස, ස්වතන්ත්‍රතාව, ඉරාන ජන රජය''

''ඒකාධිපතියා හෙලා දකිමු !'', ''කමෙනි භංග වේවා !'', ''දූෂිත, වංක ආණ්ඩුව හෙළා දකිමු !'' යනාදී වශයෙන් සුපුරුදු සටන් පාඨ, විරෝධතා පද සටන්කාමීහු බ්‍රහස්පතින්දා අඛණ්ඩව හඬ නැගූහ. එමතුදු නොව, ''අපේ රජය මළවුන් අතර වුවත්, අපේ නෙඩා (Neda),{නැතිනම් ෂොරාබ් (Shorab)} මියගිහින් නැත, ඔවුන් ජීවමානයි !'' යනුවෙන්ද හඬ අවදි කළහ.

නමුත් ටෙහෙරානයේ අති විශාල ජනකායක් මැද විරෝධතාකරුවෝ සිය උපරිම ශක්තිය යොදා කෑමොර දුන් සටන් පාඨ අතර අතිශයින්ම වැදගත් වූයේ; ''නිදහස'', ''ස්වතන්ත්‍රතාව'', ''ඉරාන ජනරජය'' ඉල්ලා හඬ නැගීමයි. 1979 දී ''විප්ලවය, නිදහස, ස්වතන්ත්‍රතාව හා ඉස්ලාමීය පාලනය'' ඉල්ලා කරන ලද උද්ඝෝෂනයට ඉඳුරාම මෙය විරුද්ධය. ඉරාන ජනරජය යනු කුමක්ද? එක්කෝ හරියටම කිසිවෙක් මෙය නොදනී. නැතිනම් අඩු තරමින් හැමෝටම බාග විට ඒ ගැන කිසිදු අවබෝධයක් නොමැති විය හැකිය. නමුත් දැන් ජනතාව පළමු කොටම ''ඉස්ලාමීය ජනරජය'' පහකර දැමීමට එකඟය. විරෝධතාකරුවන්ගේ ඉල්ලීම් අතුරින් ඉදිරියට පැමිණ ඇත්තේ මෙම නව සටන්පාඨය යි.

මෙම සටන්පාඨයේ වැදගත්කම වන්නේ එහි ප්‍රති ව්‍යුහාත්මක ගති ලක්ෂණය සහ මුළු මහත් ඉස්ලාමීය ක්‍රමය ප්‍රතික්ෂප කිරීම පමණක් නොවේ. මෙයින් පෙන්වා දෙන්නේ මෙම උඩු තෙරපුම (Upsurge) හසුරුවාලීම, පාලනය, මවුසාවි (Mousavi) විසින් මෙහෙයවනු ලබන ඊනියා ''හරිත රැල්ල'' (Green Wave) වැනි ඉස්ලාමීය ජනරජයේ කේන්ද්‍රිය චරිත හා ස්වකීය අනුගාමික ජනාධිපති අපේක්ෂක මෙහ්දි කරෝබි (Mehdi Karoubi) අතට හෙමින් සීරුවේ මාරුවෙමින් තිබීම යන්නයි. ජනතාව හඬ නගා කියා සිටියේ ඉස්ලාම් පාලන තන්ත්‍රයකට සීමාවී, හිරවී සිටීම ඔවුනට අවශ්‍ය නොවන බවත්, සිය ආධ්‍යාශය වන්නේ ඉන් ඔබ්බට ගමන් කිරීම බවත් ය.

බ්‍රහස්පතින්දා ක්‍රියාවේදී මෙම සටන්පාඨය යොදා ගැනීමට ප්‍රතික්‍රියාවක් ලෙස පෙනී ගිය දෙය නම්, අගෝස්තු 1 දා ගාලම් ප්‍රවෘත්ති සේවයට (Ghalam News) මව්සාවි කඩිමුඩියේ කියා සිටියේ ජනතාවගේ බලවත් ඉල්ලීම ඉස්ලාමීය අංගයන්ගෙන් සමන්විත පාලන ක්‍රමයේ ජනරජ ලක්ෂණ දෘෂ්ඨිය රැක ගැනීම බවයි. මෙම සටන් පාඨය, අඩු වැඩි වශයෙන් අන් කිසිවක් නොව, ඉස්ලාමීය ජනරජයක් ඉල්ලීමයි. මව්සාවිට හිතවාදී සටන්පාඨ විරලව ව්‍යාප්තවීම සහ පැමිණි ජනකාය අතර හරිත වර්ණය විරලව ප්‍රදර්ශනය වීම නිසා ඔහු විශේෂයෙන්ම කනස්සල්ලට පත් විය. බොහෝ තරුණයෝ හඬ නැගූ හා කළ දේවල් පාලන තන්ත්‍රයේ මවුසාවි හා සිය කල්ලියේ අවශ්‍යවූ දේට පටහැණි විය. මවුසාවිට අවශ්‍ය වූයේ ජනතාව මොසාලා දේවස්ථානයට පැමිණ නිහඬව සිටීමෙන් (ඔහුගේ සුපුරුදු උපදෙස්-උද්ඝෝෂකයින්ට) කුරානයේ ශුද්ධ පාඨ සජ්ඣායනා කරමින්, හෝ සෑම දෙනාම ''අල්ලා හූ අක්බාර්'' (දෙවියන් ශ්‍රේෂ්ඨයි) කියා කෑමොර දීමයි. ඇත්ත වශයෙන්ම ජනතාවට එසේ නිසොල්මන්ව නිහඬව සිටීමට අවශ්‍ය නොවීය. ඒ වෙනුවට ඔවුනට අවශ්‍ය වූයේ ඉස්ලාමීය පාලන තන්ත්‍රයට එරෙහිව දැඩිව උද්ඝෝෂණයක නිරත වීමටයි; ඔවුහු එසේ කළෝය.

උද්ඝෝෂණ ව්‍යාපාරය ආරම්භයේ සිටම මව්සාවිගේ ආධාරකරුවෝ ''අල්ලා හු අක්බාර්'' සටන් පාඨය නැගීය. මීට එකඟ නොවූ මෙන්ම ඒ ගැන අබමල් රේණුවක විශ්වාසයක් නැති තරුණයෝ උපායශීලී හේතුවක් සඳහාවත් හඬනැගීමට එසේ ඉදිරිපත් නොවූහ. නමුත් දැන් එසේ හඬ නැගීමේ ශක්තිය හීන වෙමින් පවතියි. සමහරු තර්ක කරන්නේ එක්සත්කම පවත්වා ගැනීමට සටන්පාඨ යොදා ගත් බවයි. ඒ අතර තවත් අය කියා සිටින්නේ රාජ්‍ය තන්ත්‍රයේ මැරවරයෝ සටන්පාඨ කියන අයට හිංසා කිරීමට හා අත් අඩංගුවට ගැනීමට මෙය ආයුධයක් කර ගන්නා බවයි. නමුත් මෙම හේතු එකක්වත් තව දුරටත් වලංගු නොවේ. තලා පෙලා දමන; සිරභාරයට ගන්නා; වද හිංසා පමුණුවන; අතුරුදහන් කරන එසේම මරා දැමීමට ඉදිරිපත් වූවන්ගේ ප්‍රධාන සටන් පාඨය ''අල්ලා හු අක්බාර්'' යන්න ජනතාව දැන තිබුණි. වෙනත් වචන වලින් කියන්නේ නම් එය ජනයාට, ජනතාව එක්සත් කරන සටන් පාඨයක් නොවීය. ඒ නිසා බොහෝ තරුණයෝ ''අල්ලා හු අක්බාර්'' යනුවෙන් කෑ මොර දීමට අකමැති විය. දෙවනුව, එසේ කියා පෑමෙන් රාජ්‍ය තන්ත්‍රයේ මැරවරකම් වල කෲරතර බව නිමා නොවීය. මැරයෝ ප්‍රචණ්ඩ ලෙස හා දරුණු ලෙස සටන් පාඨ කියූ ජනයාට පහර දී තිබුණි.

විරෝධතාකරුවන් වීදිවල දැනුවත් සටන් පාඨ කීමෙන් නිහඬ කිරීමට හා ඉස්ලාමීය ජන රජයේ රාමුවට දේශපාලනිකව කොටු කර ගැනීමට මවුසාවි හා ඔහුගේ ආධාර කරුවන් උත්සාහ කළා වුවත්, එමෙන්ම, විරෝධතාකරුවන් මවුසාවිගේ ආධාරකරුවන් බවත්, මෙම විප්ලවීය නැගී සිටීම බොහෝ අප්‍රමාණ ඡන්ද පිළිබඳවත්, බී.බී.සී හා ඇමෙරිකන් හඬ ඇතුළු ඉරාණය තුළ නරඹන අධිරාජ්‍යවාදී මාධ්‍යවල පූර්ණ බලාත්කාරය එය වුවත්, බහු ජනතාව දැනටමත් බොහෝ දුර ගමන් කර ඇත. දැන් මවුසාවි පිළිබඳ කිසිදු කතාබහක් නැති තරම්ය; එමෙන්ම විරෝධතාකරුවන් අතර ඔහු පිළිබඳ කැමැත්තක් නැති තරම්ය. ඔවුහු දැන් වැඩි වශයෙන් ඉලක්ක කරන්නේ ඉස්ලාමීය ජනරජයයි.

## බ්‍රහස්පතින්දා විරෝධතා ව්‍යාපාරයේ වැදගත්කම කුමක්ද?

බ්‍රහස්පතින්දා පැවති විරෝධතාවේ වැදගත් දෙය වනාහි රාජ්‍ය තන්ත්‍රයේ කෲර බව හා මධ්‍යකාලීන සිර ගෙවල්වල සිදුවූ භීතිය රජයන ක්‍රියා වන් වුවත්, ජනතාව භීතියට හෝ අධෛර්යට පත් නොවුණු බවයි. මින් රාජ්‍ය තන්ත්‍රය පැහැදිලිවම කම්පනයට පත් විය.

විරෝධය පෑමේ උද්‍යෝගය හීන කිරීම සම්බන්ධයෙන් පාලන තන්ත්‍රය කෙසේ බලපෑමක් කර තිබේදැයි යන්න මැන බැලීම සඳහා බ්‍රහස්පතින්දා පැවති උද්ඝෝෂණය බැරෝමීටරයක් (barometer) විය. පිළිතුර නම් රාජ්‍යය අවිධිමත් වී තිබීමයි. ව්‍යාපාරයට බොහෝ දුර ගමනක් තවමත් යාමට තිබේ. බොහෝ වෙනස් සාධක, ඊට නායකත්වය දෙන නිෂ්ඨාවන්, ඉලක්ක හා දැක්ම වඩාත් තීරණාත්මක ය යන්න මත සිදුවිය හැකිදේ රඳා පවතී. රාජ්‍යය හෝ පාලන කල්ලි (හෝ වෙනත් ධනේශ්වර-අධිරාජ්‍යවාදී පරායත්ත බලවේග) වලට බහුජන ව්‍යාපාරය කෙරෙහි සිය ග්‍රහණය දැඩිව පවත්වා ගැනීමට හැකි වේද? ලෝක විප්ලවයේ ආරක්ෂක මුර කුටියක් ලෙස ස්වාධීනතා, නිදහස් හා සමාජවාදී ඉරානයකට දොරගුළු විවර කළ හැකි විප්ලවීය නව ප්‍රජාතන්ත්‍රවාදී (අධිරාජ්‍යවාදී-හා වැඩ වසම් විරෝධී) රාජ්‍යයක් ස්ථාපිත කිරීම කෙරෙහි-පූර්ණ ලෙස වෙනස් දිශානතියක් තුළ සංකීර්ණ හා පීඩාකාරී මාවතක වෙහෙසකාරී හැරවුමක් හරහා සටන් කොට ග්‍රහණයෙන් මිදී ජනතාවට පෙන්විය හැකි රැඩිකල් ගාමක බලවේගයක් විද්‍යාමාන වීම එම ව්‍යාපාරය දකීද? පැහැදිලිව පෙනෙන දේ නම් කෲර බව, මර්ධනය, පීඩනය හා සුරා කෑමේ ක්‍රියාදාමයකින් 30 වසරකට පසු ප්‍රතිගාමීන් හා ජනතාව අතර තියුණු හා ප්‍රබල ප්‍රතිවිරෝධයක මුල් බැසගත් සැබෑ ශක්තියක් මේ ව්‍යාපාරය පෙන්වා තිබීමයි.

රාජ්‍ය තන්ත්‍රයේ මිලේච්ඡත්වය, කෲර බව සහ විරෝධතාකරුවන්ගේ උට්ඨාන වීර්යය ජනතාවගේ බොහෝ කොටස් ව්‍යාපාරය තුළට ආකර්ශණය කර ගනිමින් සිටිති; ඒ අතරම රාජ්‍ය තන්ත්‍රයේ පාලන කල්ලිය එන්න එන්නම හුදෙකලා වෙමින් පවතී. උදාහරණ ලෙස දක්වතොත්, බ්‍රහස්පතින්දා උදෑසන, ආරක්ෂක හමුදා බිහෙස්ට්-ඊ ෂාරා (Behest-e-Zahra) සොහොන් බිමේ දිවි පිදුවන්ට ගෞරවය දැක්වීම සඳහා ගිය කලාකරුවන් හා සිනමාකරුවන් කණ්ඩායමක් අත් අඩංගුවට ගත්තේය. ඔවුන් අතර ජාත්‍යන්තර කීර්තියට පත්, White Balloon සහ The circle and offside යන චිත්‍රපට නිෂ්පාදනය කළ සිනමා අධ්‍යක්ෂක ජෆාර් පනාහි (Jafar Panahi) ද වීය.

මෙම දැක්ම ශක්තිමත් කළ දෙය වනාහි පාලක කල්ලිය තුළම ගැඹුරු විවරයක සංඥා විද්‍යාමාන වීමය. නායක කමෙනිගේ බලපෑම ඉරානයේ ප්‍රධාන ෂියා (Shia) කවයන් තුළටත්, විශේෂයෙන්ම ෂියා ඉස්ලාමීය ප්‍රධාන ආගමික ස්ථානවලින් එකක් වන, ක්වොම් (Qom) හිත් දුර්වල වෙමින් තිබීමයි. නානාවිධ දැවැන්ත අයතුල්ලාවරුන් (ayathollahs) සහ අයතුල්ලා සේනි (Ayatollahs Sanei) ,මවුසාවි අර්ඩාබිලි, මොන්ටා ෂයිරි සහ අනෙක් ආගමික බලධාරීන් එක්සත් රාජ්‍ය තන්ත්‍රය හෙළා දැක තිබුණි. නැතිනම් විරෝධතාකරුවන් හා සිරකරුවන් පිළිබඳ අනුගමනය කරන කෲර බව කෙරෙහි අනතුරු ඇඟවූහ. ඔවුහු විශේෂයෙන් කනස්සල්ලට පත්වූයේ ඉස්ලාමීය ජනරජයේ ඉරණම පිළිබඳ ෂාගේ (Shah) කෲර බව නිසා සිය සිහසුනෙන් ඔහුට වන්දි ගෙවීමට සිදු වූ බවත්, මීට වසර 30 කට පෙර සිය රාජ්‍ය වංශය හිටි අඩියේම අවසානයට පැමිණි බව සිහිකර ලීමෙන්ය.

අභ්‍යන්තර අර්බුදයකට යෑමෙන් පාලන කල්ලි වඩා උග්‍ර රෝගී තත්ත්වයකට පත් විය. ඉරාන ජනයා හා ''ඊශ්‍රායෙල ජනයා'' මිත්‍රත්වය පිළිබඳ දැඩි විවේචනයක් කළා වූද, උප ජනාධිපති ලෙසත්, ජනාධිපති නොමැති තත්ත්වයක දී එම තනතුර හොබවන පුද්ගලයා වශයෙන් එස්ෆැන්ඩියර් රහීම් ෂොහි, ජනාධිපති අහමදිනිජාඩ් විසින් පත් කරනු ලැබූ කල්හි අර්බුදය ඉස්මතුව පැමිණියේය. මෙම පත් කිරීම මගින් ප්‍රකෝපකාරී ප්‍රතිචාර ක්‍රියාවලියක් දියත් වූයේ අහමදිනිජාඩ්ගේම කැබිනට්ටුව තුළින්ය; එක් කැබිනට් අමාත්‍යවරයෙක් සිය ඉල්ලා අස්වීම ඊට එරෙහිව තහවුරු කර තිබුණද, කීප දෙනෙක්ම කැබිනට්ටුවෙන් ඉල්ලා අස්වීම සහතික කරන ලදි. අහමදිනිජාඩ් කිසිම ඉල්ලා අස්වීමක් භාරගැනීමට ඉදිරිපත් නොවීය. ඒ මක්නිසාදයත් එසේ ඉල්ලා අස්වී ගියහොත් වර්තමාන කැබිනට් මණ්ඩලය අඩකට වඩා අඩුවන බැවිණි. එම නිසා ඔහු විරුද්ධ පක්ෂයට මුහුණ දෙන පාර්ලිමේන්තුව තුළ ව්‍යවස්ථානුකූලව විශ්වාසනීය මනාපයක් ඉල්ලා සිටීමට ඔහුට සිදුවනු ඇත(Vote of confidence). ඔහුගේම

සහ රාජ්‍ය තන්ත්‍රයේ යහපත පිණිස රහිබ් මෂාහි තනතුරෙන් පහ කිරීමට ''උත්තරීතර නායකයා'' විසින් දෙන ලද උපදේශයටද ජනාධිපති අවනත නොවීය. මින් කුලප්පු වූ සිකුරාදා යාඥාව සිදු කරන ඉස්ලාම් පූජකවරු (Imams), අතිශයින්ම රාජ්‍ය තන්ත්‍රය ගැති පූජක අහමඩ් ක්හාටාබ් සහ පාර්ලිමේන්තුවේ බොහෝ කොන්සවේටිව් මන්ත්‍රීවරුද (Conservative පවතින තත්ත්වය එසේ පවත්වාගෙන යාමට පක්ෂ) ඇතුළුව ස්වකීය කල්ලිය තුළින්මත් අහමදිනිජාඩ් ව දැඩි සේ විවේචනය විය.

මෙම වෙනස්කම් තුළින් වූ බිඳීම කමෙනි-අහමදිනිජාඩ් පාලන කල්ලිය සම්බන්ධයෙන් කෙතරම් නොගැළපේද කිව හොත්, සමහර නිරීක්ෂකයෝ විශ්වාස කළේ රට තුළ සිදුවෙමින් පවතින දේවල් වලින් ජනතාවගේ අවධානය වෙනතකට හැරවීම සඳහා මෙසේ ප්‍රදර්ශනයක් ගෙන හැර පාන බවයි. මෙය සිදු විය හැකි එක් ආකාරයකි; නමුත් ඔවුන් අතර සැබෑ වෙනස්කම් මෙන්ම ප්‍රතිවිරෝධතා ද තිබෙන්නට පුළුවන. ජනතා අරගලයේ බලපෑම ඔවුන් අතර අර්බුදයක් ඇවිස්සීමට විභවතාවයක් තිබේ. ඔවුන්ගේ සැලසුම් අසාර්ථක වීම, අතිශය මෘග බවේ සහ කෲරත්වයේ අකාර්යක්ෂමතාව විවිධ ක්‍රියා මාර්ග ඔස්සේ පරාවර්තනය විය හැකිය. ජනතා ව්‍යාපාරය ශක්තිමත්ව වර්ධනය වන විට, මෙවැනි වෙනස්කම් හා අතිශය ගැඹුරු අර්බුද වලින් පාලකයන්ට මග හැරීම දුෂ්කරය. මෙහි ද්විතීයික හේතුවක් ලෙස, වෙනත් බලවේගද බලය සෙවීමට යත්න දරති. මහා බලැති අයතුල්ලා අලි අක්බාර්, හෂෙමි රත්සන්ජානි සහ හිටපු ජනාධිපති මොහොමඩ් ක්හාටාමි වැනි මිනිසුන් ඇතුළත් පාලන තන්ත්‍රයේ අනෙක් කල්ලි සාමාජිකයින් නිකරුණේ තමන්ගේ පාඩුවේ නොසිටී. ක්‍රියාශීලීව අරගලයක යෙදී සිටින ඔවුන් පාලන බලය වෙත ජනයා දිනාගනිමින් පාලක කල්ලිය ශක්තිමත් කරමින් සිටී. එසේම අහමදිනිජාඩ් කුමක් කරමින් සිටියත් ඔහුව අනුගමනය නොකරන; පීඩනයට හසුව සිටින කමෙනි කල්ලිය තුළද සමහරු කල් ගෙවති.

අධිරාජ්‍යවාදී බලවේග ඉරානය තුළ විවිධ අයුරින් සංවර්ධන කටයුතු සිදු කිරීමට උත්සාහ දරමින් සිටී. ඔවුහු තත්ත්වයන් ඉතා සමීපව විමසමින් සිටී; තත්ත්වයන් උග්‍ර වූ මොහොතක ඔවුන් සෘජුව මැදිහත් වන බව නො අනුමානය. ඔවුන් වඩාත් සංවේදීව නිරීක්ෂණය කරන දෙයින් එකක් නම් ජනතා ව්‍යාපාරය අනුගමනය කරන මාවත යි. ජනතා ව්‍යාපාරයට නායකත්වය දිය හැකි ශක්තිමත් වූ විප්ලවවාදී බලවේගයක මතුවීම සහ ව්‍යාපාරය රැඩිකල්කරණය වීම ඔවුන් වඩාත් සිත් තැවුල් ගන්නා ප්‍රධාන සාධකයයි.

අරගලයේ අනාගත වර්ධනයන් විවිධ සාධක මත රැඳී පවතී. නමුත් ජනතාව සිය අරගලය අත් නොහැර ඉදිරියටම ගෙනයාමේ අපූර්ව අධිෂ්ඨානයක් මේතාක් පෙන්වා තිබීම සහ මේ සම්බන්ධයෙන් ජීවිත වලින් ඉහළ මිළක් ගෙවා තිබීම ද නිශ්චිතව සඳහන් කළ යුතුය. ඔවුහු දැනටමත් ඉස්ලාමීය පාලන තන්ත්‍රයට පිරිමැසිය නොහැකි පරාජයක් අත්කර දී තිබේ. ඉරාන ජනාධිපති ගේ සුජාතභාවය වාෂ්පීකරණය කර තිබේ; එම නායකයාගේ බලය, ආධිපත්‍ය අතිශය ප්‍රබල ආකාරයකින් හකුලුවා තිබේ; ආගමික රාජ්‍ය තන්ත්‍රයේ සුජාතභාවය දිනෙන් දින වැඩී එන ජනයාට ප්‍රශ්නාර්ථයක් වී තිබේ; විවිධ කල්ලි අතර ගොඩ නගා ගත් සන්ධානය කීතු කීතු වලට කඩා දමමින් සිටී; ජනතාව අතර ඊට ඇත්තේ ඉමහත් වෛරයකි. භූතයා (genie) බෝතලයෙන් එළියට පැන ඇත. නැවත බෝතලයට දමා අසුරා දැමීම පහසු නොවෙනු ඇත.

**දිනාගැනීමට ලොවක් ඇත ප්‍රවෘත්ති සේවය** (A World to Win News Service){aworldtowin.org} ලෝකයේ මාක්ස්-ලෙනින්-මාඕවාදී පක්ෂ සහ සංවිධානවල කළලමය මධ්‍යස්ථානය වන විප්ලවීය ජාත්‍යන්තරවාදී ව්‍යාපාරයේ අනුග්‍රහයෙන් සිදු කරන ලද දේශපාලනික සහ න්‍යායික විමර්ශනය වන **දිනාගැනීමට ලොවක් ඇත සඟරාව** (A World to Win Magazine) විසින් ඉදිරිපත් කරන ලදි.

නව මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායමේ පරිවර්තනයකි.
අංක 07
(T -07)

http://slmarxist.yolasite.com
slmarxist@ymail.com